මගේ අංකය : 5/5/2/GTO/2010(2019)
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2019.01.31 දින.

සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල ප්‍රධානීන්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
හා අනෙකුත් ආයතන ප්‍රධානන් වෙත,

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් (සිවිල්/යාන්ත්‍රික) සඳහා
පවත්වනු ලබන ලිඛිත විභාගය - 2010 (2019)

පූර්වෝක්ත විභාගය 2019 මාර්තු මස පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන යොදනු ලැබේ. 2010 සිට 2019 දක්වා වූ වර්ෂයනට අදාළව පැවැත්විය යුතු විභාග සියල්ලම ආවරණය වන පරිදි උක්ත විභාගය පැවැත්වෙනු ඇත.

ඒ සඳහා සංශෝධිත අයදුම්පත් හා ඇතුළත්වීමේ ලැයිස්තු 2019 පෙබරවාරි මස 22 වන දින දක්වා භාරගනු ලැබේ.

02. මෙම විභාග නිවේදනයේ අඩංගු කරුණු ඔබගේ ආයතනයේ අදාළ ශ්‍රේණිවල සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමු කරවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

03. I. <u>විභාගය</u> : මෙම විභාගය 1 වැනි, 2 වැනි සහ 3 වැනි විභාගය යනුවෙන් කොටස් 03 කට බෙදෙන අතර, පහත දැක්වෙන ශ්‍රේණිවල උසස් කිරීම සඳහා සුදුස්සන් තේරීම, එම විභායේ ප්‍රතිඵල මත සිදු කරනු ලැබේ.

1	වැනි විභාගය	:	(සිවිල්)	- උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම
1	වැනි විභාගය	:	(යාන්ත්‍රික)	- සහකාර ෆෝමන් ශ්‍රේණියට උසස් කිරීම
2	වැනි විභාගය	:	(සිවිල්)	- පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම
2	වැනි විභාගය	:	(යාන්ත්‍රික)	- ෆෝමන් II වැනි ශ්‍රේණියට උසස් කිරීම
3	වැනි විභාගය	:	(සිවිල්)	- සහකාර ඉංජිනේරු ශ්‍රේණියට උසස් කිරීම
3	වැනි විභාගය	:	(යාන්ත්‍රික)	- ෆෝමන් I වැනි ශ්‍රේණියට උසස් කිරීම

II. **<u>මෙම විභාගයේදී අයදුම්කරුවකුට පෙනී සිටිය හැක්කේ එක් ශ්‍රේණියකට අයත් විභාගයකට පමණි.</u>**

04. **<u>විභාග මධ්‍යස්ථානය :</u>** ලිඛිත විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

05. **<u>සදුසුකම් :</u>** මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම විභාග අපේක්ෂකයකම,

(අ) ස්ථිර සේවයේ නියුක්ත රජයේ/ සංස්ථා/ මණ්ඩල/ පළාත් රාජ්‍ය සේවයේ සේවකයකු විය යුතුය.

(ආ) ඉහත 03 හි දක්වා ඇති කවර හෝ ශ්‍රේණියකට උසස්වීමක් ලැබීම සඳහා හෝ කාර්යක්ෂමතා කඩඉමකින් උසස් කිරීමට හෝ මෙම විභාගයෙන් සාමර්ථයක් ලැබිය යුතු බවට, නිලධාරියා දැනට සේවය කරන තනතුරට අදාළ බඳවා ගැනීමේ හෝ උසස කිරීමේ පරිපාටියෙහි දක්වා ඇති අයකු විය යුතුය.

(ඇ) මෙම විභාගය සඳහා ඉදිරිපත් කරන අයදුම්කරුවන් ඉහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට, අදාළ ආයතන ප්‍රධානියා සෑහීමකට පත් විය යුතුය.

06. **<u>අයදුම්පත් :</u>** මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන විභාග අපේක්ෂකයින් මෙම විභාග නිවේදනයෙහි අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනව, තම තමන්ගේ අයදුම්පත 8" x 11" ප්‍රමාණයේ කඩදාසියෙහි දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ශීර්ෂ අංක 01 සිට 04 දක්වා ශීර්ෂ මුල් පිටුවටද අනෙකුත් ශීර්ෂ අනෙක් පිටු වලටද ඇතුළත්වන පරිදි තම අත්අකුරින්ම සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් වන විෂයයන් ලකුණු කිරීම සඳහා, මේ සමග සපයා ඇති විෂය ලැයිස්තුව උපයෝග කර ගත යුතුය. අයදුම්පත් ඇතුළත්වීමේ ලැයිස්තුවල උපලේඛනගත කර මා වෙත ඉදිරිපත් කිරීම, එම විභාග අපේක්ෂකයන් අයත් වන ආයතනයන්හි ප්‍රධානීන් මගින් සිදුවිය යුතු බැවින්, නියමිත දිනට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අයදුම්කරුවන් කල්වේලා ඇතිව තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් වෙත භාර දය යුතුය. මෙම විභාගය ඉල්ලුම් කිරීම සඳහා ඇතුළත්වීමේ ලැයිස්ත ආයතන ප්‍රධානන් වෙත නිකුත් කරනු ලැබේ. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත් වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

6. 1 ඉහත සඳහන් පරිදි මෙම විභාගය ශ්‍රේණි 03 කට අයත් විභාග 03 කින් යුක්ත බැවින්, ආයතන ප්‍රධානීන් තමන් වෙත ලැබෙන අයදුම්පත් එක් එක් විභාගය අනුව වර්ග කර, ඇතුළුවීමේ ලැයිස්තුවල උපලේඛනගත කර ආවරණ ලිපියක් සමඟ මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

6. 2 ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් හා ඇතුළත්වීමේ ලැයිස්තු 2019 **පෙබරවාරි මස 22 වන දින හෝ ඊට පෙර** මා වෙත ලැබෙන සේ, **"විභාග කොමසාරිස් ජනරාල්", සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඇතුළත්වීමේ ලැයිස්තු හා අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.

6. 3 අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

6. 4 කිසිදු ලයිල්ලක් හෝ සහතිකයක් අයදුම්පතට ඇමිණිය යුතු නොවේ.

6. 5 **අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම :** පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ යම් කිසි අන්දමකින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම්පත්.

(ආ) නියමිත විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය අමුණා නොමැතිව ඉදිරිපත් කර ඇති අයදුම්පත්.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්.

(ඈ) සිවිල් හා යාන්ත්‍රික යන විභාග දෙකම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත් සහ පරීක්ෂණ මට්ටම් එකකට වඩා සඳහන් කර ඇති අයදුම්පත්.

6. 6 ඉහත දෝෂ මගහරවා ගැනීම සඳහා අයදුම්පත් එවීමට ප්‍රථම එය විභාග නිවේදනයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කර අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද හා නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර ඇතුළත් කර ලදුපත නියමිත පරිදි අලවා ඇත්දැයි විමසා බලන්න. අයදුම්පතෙහි හා ලදුපතෙහි ජායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

6.7 **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්** : ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07. **විභාග ගාස්තු :** මෙම විභාගය සඳහා පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඉන්පසු ඉදිරිපත් වන සෑම අවස්ථාවකදීම පහත සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

ලිඛිත විභාග සඳහා :

විෂයයන් එකකට	-	රු. 300/-
විෂයයන් දෙකකට	-	රු. 400/-
විෂයයන් තුනකට	-	රු. 500/-
විෂයයන් හතරකට හෝ ඊට වැඩි	-	රු. 600/-
ප්‍රායෝගික කොටස සඳහා ගාස්තු	-	**රු. 1200/-**

ප්‍රායෝගික කොටස සඳහා ගාස්තු ගෙවිය යුත්තේ ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත් වන අවස්ථාවේදීය. විභාග ගාස්තු ගෙවිය යුතු අයදුම්කරුවන්, විභාග ගාස්තුව වශයෙන් ගෙවිය යුතු මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ අදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්, ප්‍රදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුවන් නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. මෙම විභාග ගාස්තු මොනම හේතුවක් නිසා හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයට මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

සැ.ය.: කලින් විභාග ගාස්තු ගෙවා අයදුම්පත් එවූ අයදුම්කරුවන් නැවත විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් කිරීම අවශ්‍ය වන්නේය. (මුදල් ගෙවූ කුවිතාන්සියේ පිටපතක් අමුණා එවන්න.)

08. **භාෂා මාධ්‍යය :** මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවකු ඉදිරිපත් වන විෂයයන් සියල්ලම සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, කිසිදු හේතුවක් නිසාවත් විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. **<u>ප්‍රවේශ පත්‍ර :</u>** විභාගය ආරම්භ කිරීමට දින දාහතරකට පමණ පෙර, නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හේ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්පතවල දක්වා ඇති රාජකාරී ලිපිනයන්ට ප්‍රවේශ පත්‍ර තැපැල් කර එවනු ලැබේ. ප්‍රවේශ පත්‍ර තැපැල් කළ බවට දැනුම් දීමක්, පුවත්පත් නිවේදනයක් මගින් හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, අයදුම්කරු විසින් හෝ ආයතන ප්‍රධානියා විසින් ඒ බව නොපමාව පහත දැක්වෙන තොරතුරු සපයමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, වෙත වාර්තා කළ යුතුය. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

1. විභාගයේ නම
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම
3. ලිපිනය
4. ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබාගතහැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය
5. ආයතන ප්‍රධානයා අයදුම්පත තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය සහ තැපැල් කාර්යාලය යනාදිය සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකයට යොමුකළ යුතුය.

10. **<u>අනන්‍යතා පත්‍ර :</u>** මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයකදීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක් ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

1. ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය

11. **<u>අත්සන සහතික කිරීම</u>** : අයදුම්පතේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගතයුතුය. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

12. **<u>ප්‍රතිඵල :</u>** ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂය සඳහා ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගන්නා හා තමා පෙනී සිටි සියලුම විෂයන්ගෙන් ලද ලකුණුවල එකතුවේ සාමාන්‍ය 45% ක් හෝ ඊට වැඩිවූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙලට සකසන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්පත හා ඇතුළත් වීමේ ලැයිස්තු ඉදිරිපත් කරන ලද ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

13. **<u>විෂය නිර්දේශය :</u>** 1979 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රකාශයට පත් කර ඇති සංශෝධිත විෂය නිර්දේශ පත්‍රිකාව සහ ව්‍යවස්ථා පිටපත් අදාළ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතන ප්‍රධානන් අතර බෙදා හැර ඇත. මෙම විෂය නිර්දේශ හෝ ව්‍යවස්ථා පිටපත් නැවත නිකුත් කිරීමක් සිදු කළ නොහැකි බව සියලුම විභාග අපේක්ෂකයන් සහ ආයතන ප්‍රධානන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

උක්ත විභාගය සම්බන්ධයෙන් මෙම විභාග නිවේදනයෙහි සඳහන් නොව කිසියම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. එසේම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

මෙම විභාග නිවේදනයෙහි අඩංගු කරුණු ඔබ ආයතනයට අයත් අදාළ ක්ෂේත්‍රයෙහි සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමු කරවන ලෙස කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී. සනත් පුජිත
විභාග කොමසාරිස් ජනරාල

උප ලේඛනය :

විෂය නිර්දේශයෙහි දක්වා ඇති පරිදි එක් එක් පරීක්ෂණයෙන් සාමර්ථයක් ලැබීම සඳහා අයදුම්කරුවන් මෙම ලේඛනයෙහි දක්වා ඇති අයුරින් විෂයය සාමර්ථය ලද යුතුය.

01. **ඉදිරිපත් වීමට අපේක්ෂිත විභාගය : සිවිල් - (1)**

1.1 **1 වන පරීක්ෂණය (සිවිල්) - උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම සඳහා.**

අනිවාර්ය විෂයයන් : (පහත දක්වා ඇති සියලුම විෂයන්)				**විෂය අංක**
1. ගණිතය (පහළ පත්‍රය)	…	…	…	01
2. ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය)	…	…	…	02
3. මැනීම හා මට්ටම් ගැනීම (පහළ පත්‍රය)	…	…	…	03
4. සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම	…	…	…	04

සහ

වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන්ගෙන් තුනක්

5. මූලික ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව	…	…	…	05
6. ජල සම්පාදන හා ජලපවහනය	…	…	…	06
7. වැඩ බිම් පාලනය	…	…	…	07
8. පාරවල් තැනීම හා නඩත්තුව	…	…	…	08

1.2 **2 වන පරීක්ෂණය (සිවිල්) - පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම සඳහා අනිවාර්ය විෂයයන් :**

1. ගණිතය (ඉහළ පත්‍රය)	…	…	…	21
2. ප්‍රමාණ ගැනීම (ඉහළ පත්‍රය)	…	…	…	22
3. මැනීම හා මට්ටම් ගැනීම	…	…	…	23
4. ඇඳීම	…	…	…	24

සහ

වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන්ගෙන් තුනක්

5. ගොඩනැගිලි ඉදිකරීම් (ඉහළ පත්‍රය)	…	…	…	25
6. ජල සම්පාදන හා ජලාපවහනය	…	…	…	26
7. පාරවල් තැනීම හා නඩත්තුව	…	…	…	27
8. පාළම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව,	…	…	…	28
9. වැඩ සංවිධාන	…	…	…	29

1.3 **3 වන පරීක්ෂණය : (සිවිල්) සහකාර ඉංජිනේරු ශ්‍රේණියට උසස් කිරීම සඳහා**

අනිවාර්ය විෂයයන් :	**විෂය අංක**
1. සිවිල් ඉංජිනේරු විද්‍යාව i	41
2. සිවිල් ඉංජිනේරු විද්‍යාව iii	44
3. සිවිල් ඉංජිනේරු විද්‍යාව iv	45
4. ගොඩනැගිලි ප්‍රමාණ ගැනීම හා ගොඩනැගිලි ඇස්තමේන්තු කිරීම	46
5. වාස්තු විද්‍යාත්මක ඇඳීම	47
6. මැනීම හා මට්ටම් ගැනීම	48

සහ

වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන්ගෙන් එක් විෂයක්

7. සිවිල් ඉංජිනේරු විද්‍යාව ii	42
8. පාරවල් තැනීම හා නඩත්තුව	43

02. **ඉදිරිපත්වීමට අපේක්ෂිත විභාගය යාන්ත්‍රික - (2)**

2.1 **1 වන පරීක්ෂණය (යාන්ත්‍රික) - සහකාර පෝමන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා පහත දැක්වෙන සියලුම විෂයයන් අනිවාර්ය වේ.**

1. ගණිතය (පහළ පත්‍රය) … … … 01
2. යාන්ත්‍රික ප්‍රමාණය … … … 09
3. යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම … … … 10
4. වැඩපල පුහුණුව … … … 11
5. ප්‍රායෝගික වැඩ (වැද්දුම් වඩුකම්හල්) ආදිය … … … 12
6. මැණිම හා මට්ටම් ගැනීම (ප්‍රායෝගික) … … … 13

2.2 **2 වන පරීක්ෂණය (යාන්ත්‍රික) - ෆෝමන් ii වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පහත දැක්වෙන සියලුම විෂයයන් අනිවාර්ය වේ.**

1. ගණිතය (ඉහළ පත්‍රය) 21
2. යාන්ත්‍රික ප්‍රමාණ ගැනීම (උසස් පත්‍රය) 30
3. යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම (ඉහළ පත්‍රය) 31
4. කර්මාන්ත ශාලා පුහුණුව 32

2.3 **3 වන පරීක්ෂණය (යාන්ත්‍රික) පෝර්මන් i වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පහත දැක්වෙන සියලුම විෂයයන් අනිවාර්ය වේ.**

1. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව i … … … 49
2. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ii … … … 50
3. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව iii … … … 51
4. ඉංජිනේරු ආර්ථික විද්‍යාව … … … 52
5. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව - ඇඳීම … … … 53

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් (සිවිල් / යාන්ත්‍රික) සඳහා පැවැත්වෙන ලිඛිත විභාගය - 2010 (2019)

Written Examination for Technical Officers (Civil / Mechanical) in the Public and Provincial Public Services – 2010 (2019)

ඉදිරිපත් වීමට අපේක්ෂිත විභාගය

සිවිල් - 1
යාන්ත්‍රික - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පරීක්ෂණ මට්ටම

1 වන පරීක්ෂණය - 1
2 වන පරීක්ෂණය - 2
3 වන පරීක්ෂණය - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සැ.යු. : අයදුම්කරුවකු හට පෙනී සිටිය හැක්කේ එක් විභාග පරීක්ෂණ මට්ටමක් සඳහා පමණි. (ව්‍යවස්ථාවේ 6. 01 (iv) අනුව)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : .....

.....

(උදා:- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

.....

(උදා:- GUNAWARDHANA. H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : .....

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : .....

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : .....

.....

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.3 දුරකථන අංකය: ජංගම | | | | | | | | | | ස්ථාවර : | | | | | | | | | | |

04. ඔබ මේ විභාගයේ දී පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් (විෂයයන් හා ඒවායේ අංක පහත දැක්විය යුතුය)

සැ.යු. :- අයදුම්කරු විසින් ව්‍යවස්ථාවේ 16.02 පරිදි ඉල්ලුම් කළ හැකි අනිවාර්ය විෂයයන් ගණන හා වෛකල්පිත විෂයයන් ගණන පමණක් ඉල්ලුම් කළ යුතුය. අමතර වෛකල්පිත විෂයන් ඉල්ලුම් නොකළ යුතුය.

	විෂයය	විෂය අංකය
1.	.....	.....
2.	.....	.....
3.	.....	.....
4.	.....	.....
5.	.....	.....
6.	.....	.....
7.	.....	.....

05. 5.1 අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුව/ ආයතනය :-

.....

5.2 කාර්යාලයීය ලිපිනය :- .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

5.3 දුරකථන අංකය : | | | | | | | | | | |

5.4 ෆැක්ස් අංකය : | | | | | | | | | | |

06. සේවා විස්තර:-

6.1 දැනට දරන තනතුර :- .....

6.2 ශ්‍රේණිය/පන්තිය :- .....

6.3 මුල් පත්වීම් ලිපියේ අංකය හා දිනය :- .....

6.4 පත්වීම ස්ථිර කරන ලද දිනය :- .....

6.5 මෙම විභාගයෙන් ඔබ සමත් වුවහොත් අපේක්ෂා කෙරෙන රැළඟ උසස්වීමේ ශ්‍රේණිය / පන්තිය :-

.....

07. 7.1 ඔබ පෙනී සිටීමට අපේක්ෂිත විභාගය අයත් ශ්‍රේණිය/පන්තිය :- .....

7.2 එම ශ්‍රේණිය/පන්තිය, සිවිල්/යාන්ත්‍රික අංශ දෙකෙන් කවරකට අයත් වේද? :- .....

08. ඔබ මීට පෙර වතාවක මෙම විභාගයට පෙනී සිටියේ නම්, විභාගය, වර්ෂය, මාසය, විභාග අංකය හා ඔබ එහිදී සාමර්ථය ලැබූ විෂයයන් මෙහි දක්වන්න.

.....

.....

09. ඔබ අංක 04 යටතේ දක්වා ඇති විෂයයන් සඳහා ප්‍රථම වතාවට පෙනී සිටින්නෙක්ද?

.....

10. විභාග ගාස්තු :

10.1 ගෙවන ලද තැපැල් / උපතැපැල් කාර්යාලය : .....

10.2 ගෙවූ මුදල : .....

10.3 ගෙවූ දිනය : ..... 10.4 ලදුපත් අංකය : .....

ලදුපත එහි එක් දාරයක් මගින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

11. 11.1 මෙම අයදුම්පතේ මා විසින් දකවන ලද සියලුම විස්තර මාගේ දැනුමේ පමණින් සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි.

11.2 විභාගයට අදාළ විභාග ගාස්තුව වශයෙන් රු. ……..ක් ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කර සිටිමි.

11.3 මා මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබුවකු නොවන බව විභාගයට පෙර හෝ ඉන් පසුව හෝ අනාවරණය වුවහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයාට මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඇත අයිතිය හා බලය අවිවාදයෙන් පිළිගනිමි.

11.4 තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :- ....

අයදුම්කරුගේ අත්සන

ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත නම් සඳහන් නිලධාරියා විසින් මෙම අයදුම්පතෙහි අංක.04, 05 සහ 06 යන ඡේදවලදී දක්වා ඇති විස්තර සත්‍ය බවත්, මෙම විභාගයට අදාළ කොන්දේසි හා ව්‍යවස්ථා යටතේ මෙම විභාගයට පෙනී සිටීමට ඔහු සුදුසුකම් ලබා ඇති බවත් මෙවර අයදුම්කොට ඇත්තේ මෙහි 07 ඡේදයෙහි දක්වා ඇති ශ්‍රේණියට/පන්තියට අයත් විභාගය සඳහා පමණක් බවත්, විභාගයට අදාළ විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.....

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :- .....